සැ. යු. - මෙවර පළවන ගැසට් පත්‍රයේ V කොටස යටතේ 2010 වර්ෂයේ ජනවාරි සිට මාර්තු දක්වා කාර්තුවට අදාළව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


අංක 1,806 - 2013 අප්‍රේල් මස 12 වැනි සිකුරාදා - 2013.04.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 538 | රජයේ නොවන දැන්වීම් ... ... ... | 540 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — | රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 539 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 545 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.-* (i) රාජ්‍ය ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය (සංශෝධන) පනත් කෙටුම්පත, 2013 පෙබරවාරි මස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) අර්ල් ගුණසේකර පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2013 පෙබරවාරි මස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 මැයි මස 03 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 අප්‍රේල් මස 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

පී. එච්. එල්. වී. ද සිල්වා,
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*.

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**අධිකරණ භාරයට ගන්නා ලද අයිතිකරුවන් නොමැතිව රාජ්‍ය සන්තක කරන ලද මෝටර් රථ මුද්‍රා තැබූ මිල ගණන් කැඳවා විකිණීම පිණිස මහාධිකරණය විසින් ටෙන්ඩර් පත්‍රිකා කැඳවීම - 2013**

වාලච්චේන දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය විසින් අත්පත් කර ගන්නා ලද අයිතිකරුවන් නොමැතිව රාජ්‍ය සන්තක කරන ලද මෝටර් රථ ප්‍රසිද්ධ මිල ගණන් කැඳවීම යටතේ විකිණීමට තිබේ. මේ සඳහා වූ ඉල්ලුම්පත්‍ර 2013 අප්‍රේල් මස 29 වැනි දින ප. ව. 3.00 දක්වා භාරගනු ලැබේ.

සියලු ඉල්ලුම්පත්‍ර "මහාධිකරණ විනිසුරු, මහාධිකරණය, මඩකලපුව" යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් යොමු කළ යුතු ය.

මහාධිකරණ මුද්‍රාව හා මහාධිකරණ ගණකාධිකාරී තැනගේ අත්සන සහිත ඉල්ලුම්පත්‍ර පමණක් පාවිච්චි කළ යුතු ය.

මෙලෙස ටෙන්ඩර් පත්‍රිකා මගින් විකිණීමට තීරණය කර ඇති වාහනවල අයිතිය ඉල්ලන කවුරු හෝ සිටී නම්, ටෙන්ඩර් පත්‍රිකා කැඳවීමේ අවසාන දින ප. ව. 3.00 ට පෙර ලේඛන සහිතව තමන්ගේ අයිතිය ඉල්ලීම් මගින් ඉදිරිපත් කළ යුතු ය. එසේ කිරීමට අපොහොසත් වන්නේනම් පසුව ඒ සම්බන්ධයෙන් කිසිදු සැලකිල්ලක් නොදක්වන බවත් දන්වා සිටිමු.

එක් එක් මෝටර් රථ සඳහා වෙන වෙන ම ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ යුතු ය. ඒ සඳහා ආපසු නොගෙවනු ලබන රු. 100ක් සමග, පහත පරිදි තැන්පත් මුදල් තැන්පත් කළ යුතු ය. මෙම ඉල්ලුම්පත්‍ර නිකුත් කිරීම 2013 අප්‍රේල් මස 29 වැනි දින පෙ. ව. 11.30 ට අවසන් වනු ඇත.

| අනු. අංක | වාහනයේ විස්තර | විකිණීම සඳහා ලබාදෙන ලද අංක | තැන්පත් මුදල රු. |
|---|---|---|---|
| 01. | ට්‍රේලරය සහිත ට්‍රැක්ටර් 01 | 01/2013 | 5,000 |
| 02. | ත්‍රිරෝද රථ - 01 | 02/2013 | 2,000 |
| 03. | ත්‍රිරෝද රථ - 01 | 03/2013 | 2,000 |

වලංගු කාලය තුළ ලැබෙන මුද්‍රා සහිත සියලු ඉල්ලුම්පත්‍ර 2013 අප්‍රේල් මස 29 වැනි දින ප. ව. 3.00 ට පැමිණ සිටින ඉල්ලුම්කරුවන් ඉදිරිපිට, මහාධිකරණ සම්පාදන කමිටුව විසින් විවෘත කරනු ලැබේ.

ටෙන්ඩර් පත්‍රිකා මගින් ඉහළ මිලක් සඳහන් කොට ඉල්ලුම්කර ඇති ඉල්ලුම්කරුවන්ට එම වාහනය විකිණීමට මඩකලපුව මහාධිකරණ සම්පාදන කමිටුව අනුමැතිය ලබා දෙයි. ඒ අනුව ඉදිරි විකිණීම් කටයුතු අදාළ වාලච්චේන දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය විසින් සිදුකරනු ලැබේ.

ටෙන්ඩර් කැඳවීම මගින් විකිණීමට තීරණය කර ඇති වාහන කාර්යාල දිනවල පෙ. ව. 10.00 සිට ප. ව. 2.30 දක්වා වූ කාලය තුළ අදාළ වාලච්චේන දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්ගේ අවසරය ඇතුව නිරීක්ෂණය කළ හැකි ය.

විකිණීමට තීරණය කර ඇති වාහන සඳහා තක්සේරු මිල ලබාගෙන ඇති බැවින් ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් පත්‍රිකාවල සඳහන් මිල තක්සේරු මිලට වඩා අඩුවෙන් පවතියි නම්, එම් වාහන විකිණීම අත්හිටුවා දැමීමට අධිකරණයට පූර්ණ බලය ඇත.

විකුණන ලද වාහන, මුදල් ගෙවා රිසිට් පත් ලබාගත් වහාම අධිකරණ භූමියෙන් ඉවත් කළ යුතු ය. එමෙන් ම සියලු ගෙවීම් මුදලින් සිදු කළ යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

මහාධිකරණ විනිසුරු,
මහාධිකරණය,
මඩකලපුව.

| අනු. අංක | නඩු අංක | වාහනයේ විස්තර | වර්ගය |
|---|---|---|---|
| 01. | 483/PC | ට්‍රේලරය සහිත ට්‍රැක්ටර් - 01 | MAHENDRA 575 |
| 02. | 11132/E | ත්‍රිරෝද රථ - 01 | BAJAJ PREMIUM SPORTS |
| 03. | 11383/ E | ත්‍රිරෝද රථ - 01 | BAJAJ 4 S |

04-332

# බඩු බාහිරාදිය විකිණීම්

## ගාල්ල මහෙස්ත්‍රාත් අධිකරණය

ගාල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු භාණ්ඩ වශයෙන් ඇති රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් පෑමක් නොකළ පහත සඳහන් භාණ්ඩ 2013.04.28 වැනි ඉරිදා දින පෙ. ව. 9.00 ට අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් කිසියම් භාණ්ඩයක් සඳහා හිමිකම් දක්වන්නෙකු වේ නම් වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත එදින වෙන්දේසිය පැවැත්වීමට පෙර භාණ්ඩ පරීක්ෂා කළ හැකි ය.

04. අධිකරණය මගින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවන්හි දී අධිකරණයේ අභිමතය පරිදි ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ පූර්ණ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ දී මිල දී ගනු ලබන ද්‍රව්‍යයන් සඳහා එවෙලේ ම මුදල් ගෙවා එකී භාණ්ඩ අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

06. භාණ්ඩ ගැණුම්කරුවන් ඔවුන්ගේ ජාතික හැඳුනුම්පත රැගෙන ආ යුතු ය.

උමේෂ් ශානක කලංසූරිය,
මහෙස්ත්‍රාත්,
ගාල්ල.

2013 මාර්තු මස 20 වැනි දින,
ගාල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### වෙන්දේසි නඩු භාණ්ඩ ලැයිස්තුව - 2013

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 01. | 95498 | ඉරුම් කියත් තලය අඩංගු ලී බංකුව |
| 02. | 94011 | ඉරුම් කියත් සවිකරන ලද ඉරුම් බංකුව |
| 03. | 94012 | ඉරුම් කියත සවිකරන ලද ඉරුම් බංකුව |
| 04. | 95004 | ඉරුම් කියත සවිකරන ලද ඉරුම් බංකුව |
| 05. | 95278 | යකඩ රාමුව සහිත උඩ කොටස ලෑලි සහිත ඉරුම් බංකුව |
| 06. | 91793 | තලය සහිත ලී බංකුව |
| 07. | 90181 | තලය සහිත ඉරුම් බංකුව 01 |
| 08. | 96839 | තලය සහිත ඉරුම් බංකු 01 |
| 09. | අංක රහිත | තලය සහිත ඉරුම් බංකු 01 |
| 10. | අංක රහිත | තලය සහිත ඉරුම් බංකු 01 |
| 11. | 96465 | තලය සහිත කියත් තලය සහිත බංකු 01 |
| 12. | අංක රහිත | හිස් වීදුරු බෝතල් තොගයක් |
| 13. | 2502 | චෙන්සෝ 01 |
| | එම | පොරව 01 |
| 14. | 94806 | සවල් 02 |
| 15. | 89112 | පාරු 03 |
| 16. | අංක රහිත | බූලි තොගය |
| 17. | අංක රහිත | ප්ලාස්ටික් බියර් කේස් කීපයක් |
| 18. | ඒ. ආර්. 2486 | පාපැදියක් |
| 19. | අංක රහිත | පාපැදි 01 |
| 20. | අංක රහිත | පාපැදි 01 |
| 21. | අංක රහිත | පාපැදි 01 |
| 22. | අංක රහිත | පාපැදි 01 |
| 23. | අංක රහිත | පාපැදි 01 |
| 24. | අංක රහිත | පාපැදි 01 |
| 25. | අංක රහිත | පාපැදි 01 |
| 26. | අංක රහිත | පාපැදි 01 |
| 27. | අංක රහිත | පාපැදි 01 |
| 28. | 29750 | 109-9263 හොණ්ඩා CM 125 යතුරු පැදිය |
| 29. | 13898 | 132-7783 හොණ්ඩා MD 90 යතුරු පැදිය |
| 30. | 10748 | 148-0057 හොණ්ඩා YL 505 යතුරුපැදිය |
| 31. | 55244 | SPVE 5403 බජාජ් ප්ලැටිනම් වර්ගයේ යතුරු පැදිය |
| 32. | 22733 | අංක රහිත යතුරු පැදිය |
| 33. | ඒ. ආර්. 1322 | 151- 2120 බජාජ් ක්ලැසික් වර්ගයේ යතුරුපැදිය |
| 34. | ඒ. ආර්. 1809 | අංක රහිත හීරෝ වර්ගයේ යතුරුපැදිය |
| 35. | ඒ. ආර්. 1321 | 141-8310 බජාජ් 980 වර්ගයේ යතුරුපැදිය |
| 36. | ඒ. ආර්. 1523 | SPVN 7998 TVS යතුරු පැදිය |
| 37. | ඒ. ආර්. 2600 | WPUF 7167 යතුරුපැදිය |
| 38. | 2187/01 | 86/4089 හොණ්ඩා CD 125 වර්ගයේ යතුරුපැදිය |
| 39. | ඒ. ආර්. 1356 | 157-7242 හොණ්ඩා වර්ගයේ යතුරුපැදිය |
| 40. | ඒ. ආර්. 1356 | 142-6011 හොණ්ඩා XL 125 R වර්ගයේ යතුරු පැදිය |
| 41. | අංක රහිත | 89-9402 හොණ්ඩා CM 125 වර්ගයේ යතුරු පැදිය |
| 42. | අංක රහිත | ලී ඉරීමට ගන්නා ඉරුම් බංකු 01 |
| 43. | ඒ. ආර්. 2487/13 | ජංගම දුරකථනය |
| 44. | ඒ. ආර්. 2486/13 | පාපැදියක් |
| 45. | ඒ. ආර්. 2485 | ජංගම දුරකථනය |
| 46. | ඒ. ආර්. 371/12 | ජංගම දුරකථනය |
| 47. | ඒ. ආර්. 701 | බයිසිකල් පෙට්ටියක් |
| 48. | අංක රහිත | තරාදි කීපයක් |
| 49. | ඒ. ආර්. 25/09 | දිරාගිය යකඩ කුරක් |
| 50. | | දිරාගිය පාපැදියක් |
| 51. | | ක්‍රියා විරහිත ෆැක්ස් මැෂින් 01 |
| 52. | | ක්‍රියා විරහිත ෆොටෝකොපි මැෂින් 01 |
| 53. | | අබලි යතුරු ලියන 13 |
| 54. | | යතුරු ලියන පුටු 05 |
| 55. | | අත් ඇඳි සහිත පුටු 05 |
| 56. | | සාමාන්‍ය පුටු 05 |
| 57. | | වානේ කුෂන් පුටු 06 |
| 58. | | නීතිඥ පුටු 10 |
| 59. | | පරිගණක පුටු 01 |
| 60. | | ඇඳි සහිත බංකු 01 |
| 61. | | විදුලි පංකා (සිවිලින්) 21 |
| 62. | | විදුලි පංකා (මේස) 05 |
| 63. | | දිරාගිය ලී බන්දේසි කීපයක්. |

04-330

# රජයේ නොවන දැන්වීම්

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සියලුම දෙනා වෙත දන්වා සිටින වග මෙසේ ය :

මඩපාත අංක 69/1 හි පදිංචි අංක 340013239 V දරන ජාතික හැඳුනුම්පත් හිමි වේලාතන්ත්‍රිගේ කොමලතුංග හරිපාල බොතේජු වන මම, මා විසින් මඩපාත අංක 69/1 640270365 V දරන ජාතික හැඳුනුම්පත හිමි කුලප්පුතන්ත්‍රිගේ කමල් හසන්ත යන අය මාගේ ඇටර්නි බලකරු වශයෙන් පත් කරමින් කොළඹ දිස්ත්‍රික්කයේ ජඹුරැලිය පදිංචි ප්‍රසිද්ධ නොතාරිස් ජී. ඩී. චන්ද්‍රදාස මහතා විසින් වර්ෂ 2003ක් වූ අගෝස්තු මස 13 වැනි දින ලියා සහතික කරන ලද අංක 882 දරන ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරන බවත්, එකී මාගේ ඇටර්නි බලකරු විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවක් පෙනී සිටීමක් ගනුදෙනුවක් සම්බන්ධයෙන් මා වග නොකියන බව මෙයින් දැනුම් දෙමි.

වේලාතන්ත්‍රිගේ කොමලතුංග හරිපාල බොතේජු.

04-205

---

## නිවේදනය

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව අපි මෙයින් නිවේදනය කර සිටිමු.

සමාගමේ නම : ටෙස්කෝ ලංකා මාකටිං (පී. වී. ටී.) එල්. ටී. ඩී.
සමාගම ලියාපදිංචි අංකය : පී වී 77712
සමාගම ලියාපදිංචි කළ කාර්යාලය : මිරිහානේගම, වාරියපොල
සමාගම ලියාපදිංචි කළ දිනය : .2011.03.11

04-282/1

---

## නිවේදනය

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව අපි මෙයින් නිවේදනය කර සිටිමු.

සමාගමේ නම : මෝලි ක්ලෙයර් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම ලියාපදිංචි අංකය : පී වී 85846
සමාගම ලියාපදිංචි කළ කාර්යාලය : අංක 19 ඒ, එම්. ජේ. සී. ප්‍රනාන්දු මාවත, ඉඩම, මොරටුව
සමාගම ලියාපදිංචි කළ දිනය : .2012.05.09

04-282/2

---

## නිවේදනය

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව අපි මෙයින් නිවේදනය කර සිටිමු.

සමාගමේ නම : සමනල ඇග්‍රි බිස්නසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම ලියාපදිංචි අංකය : පී වී 68291
සමාගම ලියාපදිංචි කළ කාර්යාලය : අංක 544/91, තල්කටුව වතුයාය, දුම්මලසූරිය
සමාගම ලියාපදිංචි කළ දිනය : .2009.09.02

04-282/3

## නිවේදනයයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව අපි මෙයින් නිවේදනය කර සිටිමු.

සමාගමේ නම : රබර් සෝල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 90829
ලියාපදිංචි කාර්යාලය : 61 සී 1/1, හලම්බගස්වල, තිස්සමහාරාමය
සංස්ථාපිත දිනය : 2013.02.26.

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

04-283

---

## ඇටර්නි බලය අවලංගු කිරීම

සීවිව්, වැල්ලවත්ත, බලපිටිය හි පදිංචි රන්හුළු රංජිත් යසරත්න වන මට, වර්ෂ 2012.08.16 වැනි දින, ප්‍රසිද්ධ නොතාරිස් රංජනී ඩබ්. ලමාහේවා මිය විසින් ලියා සහතික කරන ලද අංක 904 දරන ඇටර්නි බලපත්‍රය මඟින්, ශ්‍රී ලංකාවේ නුගගල මාවත, හිනිදුම, ගාල්ල හි පදිංචි ගර්ට්රූඩ් ගුණසේකර වෙත පවරනු ලැබූ ඉහත කී ඇටර්නි බලය මෙයින් අවලංගු කොට නිෂ්ප්‍රභා කරන බවත්, මෙහි සඳහන් දිනයට පසුව එළඹෙන දිනයක මා වෙනුවෙන් ඉහත සඳහන් ඇටර්නි බලලාභි මෙම කරුණට අදාළව කරන කිසිදු ක්‍රියාවක් වෙනුවෙන් වගකීමට මා බැඳී නොසිටින බවත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පොදු ජනතාවට මෙයින් දන්වා සිටිමි.

රන්හුළු රංජිත් යසරත්න.

2013 මාර්තු මස 11 වැනි දින.

04-304

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපනය කර ඇති බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : කේ. සී. ඩබ්ලිව්. සිලෝන් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී වී 90445
ලියාපදිංචි ලිපිනය : අංක 184, දූව පාර, කෝට්ටේ

සමාගමේ නම : පෙනින්සුලා ෆුඩ්ස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී වී 91157
ලියාපදිංචි ලිපිනය : අංක 51- 5/2, 37 වැනි වීදිය, වැල්ලවත්ත, කොළඹ 06

සමාගමේ නම : කලම්බු ස්පෙෂලයිස්ඩ් ක්ලිනික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 91470
ලියාපදිංචි ලිපිනය : අංක 385/6, මීගමුව පාර, වත්තල.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෝපරේට් ඩී සොලිෂියෝ (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.

04-309

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපනය කරනු ලැබ ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : මෙට්රෝ ලයිෆ් ලැබොරටරි (පුද්ගලික) සමාගම
ලියාපදිංචි අංකය : පී වී 73205
ලියාපදිංචි කාර්යාලය : අංක 1/27, විජය පෙදෙස, ගංගොඩවිල, නුගේගොඩ.

සමාගම් ලේකම්.

04-310

### සංස්ථාගත කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය

සමාගමේ නම : හැන්ඩ්මේඩ් ක්‍රියේටර්ස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 91324
සංස්ථාගත කළ දිනය : 2013.03.04
සමාගමේ ලියාපදිංචි ලිපිනය : අංක 330, 2 වැනි හරස් මුහුද පාර, නාවට්කුඩා නැගෙනහිර, මඩකලපුව.

හැන්ඩ්මේඩ් ක්‍රියේටර්ස් (පීවීටී) එල්ටීඩී,
සමාගම් අධ්‍යක්ෂ.

2013 මාර්තු මස 12 වැනි දින.

04-312

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

සියලු දෙනාම මෙයින් දැනගත යුතුයි.

මෙහි පහත අත්සන් කරන කොළඹ 13, කොටහේන, ශාන්ත බෙනඩික්ට් මාවත, අංක 64-1/1 දරන ස්ථානයේ දෙදෙනාම පදිංචි, ආරුමුගම් අරසකෝන් සහ ඔහුගේ බිරිඳ වන චන්තිරෝදයම් අරසකෝන් වන අපි කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සිවගුරු මහාලිංගම් මහතා විසින් ලියා සහතික කරන ලද අංක 3147 හා වෙළුම් අංක 156 පිටු අංක 378 හි 2008.03.21 වැනි දින ලියාපදිංචි වී ඇති ඇටෝර්නි බලපත්‍රයෙන් කොළඹ 06, වැල්ලවත්ත, හැම්ප්ඩන් ලේන් හි අංක 91/4, දරන ස්ථානයේ පදිංචි, සිවඥානසුන්දරම් සුරේන්ද්‍රජිත් සහ ඔහුගේ බිරිඳ වන දූෂ්‍යාන්තිනි සුරේන්ද්‍රජිත් යන අයට ලබා දී තිබුණ ඇටෝර්නි බලය මෙයින් අවලංගු කරන බවට මහජනතාවට සහ ශ්‍රී ලංකා ජනරජයට දැනුම් දෙමු.

ආරුමුගම් අරසකෝන්,
චන්තිරෝදයම් අරසකෝන්.

2013 මාර්තු මස 21 වැනි දින.

04-314

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

පන්නල, තලම්මහර, කැකිල්ලපිටිය පාර, අංක 582 දරන ස්ථානයේ පදිංචි දොඹගහගේ ශ්‍රියාරත්න පෙරේරා (ජා. හැ. අංක 461560482 V හිමි) වන මම අයි. ජී. මුනසිංහ ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද, වර්ෂ 2008 ක් වූ මැයි මස 19 වැනි දිනැති අංක 8306 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මත නාඋල අරංගල අංක 179/1 දරන ස්ථානයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 430710718 V හිමි කන්දේගෙදර ධර්මදාස යන අයට පවරා දුන් මගේ ඇටෝර්නි බලය අද දින සිට අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ට කරන බව මෙයින් දැනුම් දෙමි.

04-316

### ප්‍රසිද්ධ දැන්වීමයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තියේ ප්‍රතිපාදනයන්ට අනුකූලවයි.

සමාගමේ පෙර නාමය : ඩච් වෝල් ආර්කේඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 88467
ලියාපදිංචි ලිපිනය : අංක 83, එච්. කේ. එඩ්මන්ඩ් මාවත, ගාල්ල.
සමාගමේ නව නාමය : රෝයල් ජෙම් ඇන්ඩ් ජුවෙලරි කොම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්

එම්. එන්. ඇසෝසියේට්ස් මැනේජ්මන්ට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්.

අංක 51,
තුන්වැනි පටුමග,
කටුගොඩ,
ගාල්ල.

04-350

### සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (1) වැනි වගන්තිය යටතේ මහජනයා වෙත කරන දැන්වීමයි.

සමාගම් නාමය : ඒ. එම්. මෝටර් ට්‍රේඩිං කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 69991
ලියාපදිංචි කළ දිනය : 2009.11.17
කාර්යාල ලිපිනය : අංක 180/6, අත්තනගල්ල පාර, පස්යාල.

ජී. එන්. නිෂාන්ති,
අධ්‍යක්ෂ.

04-351

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම් සංස්ථාපය කිරීම පිළිබඳ දැනුම් දීමයි.

1. සමාගමේ නම : රන්මල් ෆ්ලෝරා (ප්‍රයිවට්) ලිමිටඩ්
   සමාගම් අංකය : පී වී 91345
   ලියාපදිංචි කළ දිනය : 2013.03.05
   ලියාපදිංචි ලිපිනය : 40, ගල්කන්ද වත්ත, මුඳුන්න, උහුමීය

2. සමාගමේ නම : ලුමියා ඩිජිටල් (ප්‍රයිවට්) ලිමිටඩ්
   සමාගම් අංකය : පී වී 91287
   ලියාපදිංචි කළ දිනය : 2013.03.01
   ලියාපදිංචි ලිපිනය : අංක 42, යූ. සී. ක්වාටර්ස්, පෝල්ස් පාර, පුත්තලම.

සී. ඒ. එස්. කෝපරේට් සර්විසස් (පුද්.) සමාගම,
ලේකම්වරු.

04-354

## ඇටෝර්නි බලපත්‍රයන් අවලංගු කිරීම

කරවෙඩ්ඩි කරණවයි උතුර පදිංචි අප සිවසම්බු සෙන්තිල්නාතන් සහ සෙන්තිල්නාතන් සුබොතිනී මහජනතාවට දක්වන වග නම්, (අංක 10834) ඇටෝර්නි බලපත්‍රය සිවසම්බු ජයනාතන් යන අයට පැවරූ (අංක 10834) ඇටෝර්නි බලපත්‍රය අද දින සිට නැවත පවරා ගත් බවත්, එහි අඩංගු සියලු බලතල වගකීම් අප දරන බවත් මෙයින් සඳහන් කරමු.

සිවසම්බු සෙන්තිල්නාතන්,
සෙන්තිල්නාතන් සුබෝතිනී,
කරණවායි උතුර,
කරවෙඩ්ඩි.

04-361

## 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය යටතේ නිවේදනය

සමාගමේ නම : කැනඩා ඉමිග්‍රේෂන් සෙන්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 80959
ලිපිනය : අංක 7, කුරුප්පු පාර, කොළඹ 08
සංස්ථාගත කිරීමේ දිනය : 2011 අගෝස්තු මස 29 වැනි දින.

අධ්‍යක්ෂ.

04-362

## ප්‍රසිද්ධ දැන්වීමයි

පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීම පිළිබඳව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ද ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : සැන්රොක් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 70698
ලියාපදිංචි කාර්යාලය : අංක 201, කිරිබේරිය පාර, සමගි මාවත හන්දිය, පානදුර.
සංස්ථාගත කළ දිනය : 2010.01.13

එම්. එල්. ප්‍රනාන්දු.
අධ්‍යක්ෂ.

04-367

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත නම් සඳහන් සමාගම සංස්ථාපනය කරන ලදීඃ-

නම : ඇක්ෂියම් වන් (ප්‍රයිවට්) ලිමිටඩ්
අංක : පී වී 91542
ලියාපදිංචි ලිපිනය : අංක 326/2, පිටකෝට්ටේ, කෝට්ටේ
දිනය : 2013.03.21

වසන්ත කුමාරි ගුණසේකර,
ලේකම්.

04-366

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ඉඹුල්ගොඩ, ඉහළ ඉඹුල්ගොඩ අංක 53/1 හි පදිංචි සමරකෝන් ආරච්චිලාගේ ගර්ටි සමරකෝන් (ජා. හැ. අ. 347960248 V හිමි) වන මා ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් නීතිඥ වරුණි හිමාලි වායා එදිරිසිංහ අබේනායක මහත්මිය විසින් ලියා සහතික කළ අංක 456 හා 2012.10.28 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රයෙන් ඉඹුල්ගොඩ, ඉහළ ඉඹුල්ගොඩ අංක 53/1 හි පදිංචි මද්දුම ආරච්චිලාගේ ඊවා මොරින් (ජා. හැ. අංක 595871298 V හිමි) යන අයට පවරන ලද ඇටෝර්නි බලපත්‍රය හා එහි බලයන් මෙයින් අවලංගු කරන අතර, එකී ඇටෝර්නි බලපත්‍රය මත කිසිදු කාර්යයක් මින්මතු වලංගු නොවන බවට, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට හා සියලුම මහජනතාවගේ දැනගැනීම පිණිස මෙයින් ප්‍රකාශයට පත් කර සිටිමි.

සමරකෝන් ආරච්චිලාගේ ගර්ටි සමරකෝන්,

2013ක් වූ මාර්තු මස 24 වැනි දින දී ය.

04-339

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය ප්‍රකාරව හොබි ටෙක් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම 2012 ජුනි මස 01 වැනි දින සංස්ථාගත කළ බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : හොබි ටෙක් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම
සමාගම් අංකය : පී. වී. 86297
ලියාපදිංචි ලිපිනය : අංක 23/1, කැප්ටන් කැළුම් රාජපක්ෂ මාවත, වත්තල.

සරත් පෙරේරා,
සමාගම් ලේකම්.

04-337

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපිතකොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නාමය : සෙට්මිල් හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 91510
ලියාපදිංචි ලිපිනය : 4 වැනි මහල, සෙට්මිල් මැරිටයිම් සෙන්ටර්, අංක 56, ශ්‍රීමත් රාමනාදන් මාවත, කොළඹ 15.
සමාගම ලියාපදිංචි දිනයඃ 2013 මාර්තු මස 13 වැනි දින.

04-341

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) දරන වගන්තිය ප්‍රකාර, සිලාන් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ් 2013 මාර්තු මස 14 වැනි දින සිට ඉහත කී පනතේ ම 8 වැනි වගන්තියේ ප්‍රතිපාදනයන්ට අනුකූලව, එහි නම ජෙට්වින්ග් ඇඩ්වෙන්චර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වශයෙන් වෙනස් කරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

කලින් භාවිතා කළ නම : සිලාන් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 76382
ලියාපදිංචි කාර්යාලය : "ජෙට්වින්ග් හවුස්", 46/26, නවම් මාවත, කොළඹ 02.
සමාගමේ නව නාමය : ජෙට්වින්ග් ඇඩ්වෙන්චර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

ජෙට්වින්ග් ඇඩ්වෙන්චර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

04-335

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර දැන්වීමයි

සමාගමේ නාමය : වූ සන් එකෝ හෝම්ස් (පීවීටී) එල්ටීඩී
අංකය : පී වී 91574
සංස්ථාපන දිනය : 2013.03.18
ලියාපදිංචි කාර්යාලය : අංක 30, තක්ෂලා පාර, සරික්කාමුල්ල, කෙසෙල්වත්ත, පානදුර.

ඩෙරික් සමරසේකර සහ සමාගම,
සමාගම් ලේකම්වරුන්.

04-386

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපනය කිරීම පිළිබඳ දැනුම් දීමයි:-

සමාගමේ නම : ටුවර් බිල්ලූ හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 91474
ලියාපදිංචි කළ දිනය : 2013.03.12
ලියාපදිංචි ලිපිනය : 3 ඒ, ධර්මපාල මාවත, ඕෆ් ඇල්ප්‍රඩ් හවුස් ඇවනියු, කොළඹ 03.

ලේකම්.

04-387

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥා පනතේ 9 වැනි වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම.

සමාගමේ නම : රන් වැලි හයිඩ්‍රෝ පවර් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 71553
ලියාපදිංචි ලිපිනය : අංක 35 බී 1, ගැමුණු පුර 2 වන මාවත, කොතලාවල, කඩුවෙල
ලියාපදිංචි දිනය : 2010.03.17.

04-399

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9 වැනි වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම

සමාගමේ නම : ඉනොවේටිව් සොෆ්ට්වෙයා ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 71956,
ලියාපදිංචි ලිපිනය : අංක 149/12ඒ, ග්‍රීන් වැලි අතුරුගිරිය පාර, හෝමාගම
ලියාපදිංචි දිනය : 2010.05.03.

04-400

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම.

සමාගමේ නම : එලිප්සිස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි අංකය : පී වී 82664,
ලියාපදිංචි ලිපිනය : 4 වැනි මහල, අංක 77, ධර්මපාල මාවත, කොළඹ 03
ලියාපදිංචි දිනය : 2011.11.25

04-397

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9 වැනි වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම

සමාගමේ නම : සුප්‍රීම් ලංකා ඇග්‍රෝ ප්‍රොඩක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 62504
ලියාපදිංචි ලිපිනය : අංක 405/එෆ්, සමන්පුර, කොට්ටාව
ලියාපදිංචි දිනය : 2007.12.26

04-398

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ:-

නම : ඉසිකැෂ් (පුද්ගලික) සමාගම
ලියාපදිංචි දිනය : 2012.05.09
සමාගමේ අංකය : පී වී 85862
ලියාපදිංචි කාර්යාලය : අංක 5/3, හුළුදාගොඩ පාර, ගල්කිස්ස.

සමාගම් ලේකම්.

03-385/1

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

නම : ඩී ඇන්ඩ් එම් ටෙක් සර්විසස් (පුද්ගලික) සමාගම
ලියාපදිංචි දිනය : 2013.03.18
සමාගමේ අංකය : පී වී 91573
ලියාපදිංචි කාර්යාලය : අංක 135/4 ඩී, පහළ බියන්විල, කඩවත.

සමාගම් ලේකම්.

03-385/2

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපනය කිරීම පිළිබඳ දැනුම් දීමයි.

සමාගමේ නම : ට්‍රෙන්ඩ් කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 91104
ලියාපදිංචි කළ දිනය : 2013.02.18
ලියාපදිංචි ලිපිනය : අංක 281/-1/6, ආර්. ඒ. ඩී. මෙල් මාවත, කොළඹ 03.

ලේකම්.

03-384

---

### දැන්වීමයි

2007 වර්ෂයේ 07 වැනි කම්පැණි පනත යටතේ 09 වැනි වගන්තියට අනුව කල්තුර (ප්‍රයිවට්) ලිමිටඩ් 2010.06.10 වැනි දින සංස්ථාගත කරන ලද බව මෙයින් ප්‍රසිද්ධව දැනුම් දෙමි.

සමාගමේ නම : කල්තුර (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 71952
ලියාපදිංචි කරන ලද ලිපිනය : අංක 37, 1/15, සාගර වීදිය, කොළඹ 04.

සමාගමේ ලේකම්තුමාගේ නියෝගය පරිදි.

03-381

---

### ස්ටෙරෙඩියන් කැපිටල් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳව මහජනතාවට කෙරෙන දැනුම් දීමයි.

2013 මාර්තු මස 14 වැනි දින සමාගම් ලියාපදිංචි අංක පී වී 91493 යටතේ ස්ටෙරෙඩියන් කැපිටල් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට) ලිමිටඩ් යන නාමය යටතේ නව සමාගමක් සංස්ථාගත කරනු ලැබ ඇති බව සහ නව සමාගමේ ලියාපදිංචි කාර්යාලීය ලිපිනය කොළඹ 03, ඩීල් පෙදෙස, අංක 2, එම් ඇන්ඩ් එන් ගොඩනැගිල්ල (5 වැනි තලය) හි, බව අපි මෙයින් මහජනතාවට දැනුම් දෙමු.

සරවණන් නීලකන්ඩන්,
අධ්‍යක්ෂ/ලේකම්,
එම් ඇන්ඩ් එන් ඒජන්ට්ස් ඇන්ඩ් සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(සමාගමේ සමාගම් ලේකම්වරු),

එම් ඇන්ඩ් එන් ගොඩනැගිල්ල,
(5 වැනි තලය),
අංක 2, ඩීල් පෙදෙස,
කොළඹ 03.

04-378

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව සමාගමක් සංස්ථාපනය කිරීම පිළිබඳවයි.

සමාගමේ නාමය : බී ජී එන් ඉන්ඩස්ට්‍රියල් ටයර් (පී වී ටී) එල්ටීඩී
සමාගමේ අංකය : පීවී 91512
ලියාපදිංචි දිනය : 2013.03.13
ලියාපදිංචි ලිපිනය : අංක 81/4, පුවක්ගහවිල පාර, වේරගල, පාදුක්ක.

ලේකම්වරුන්.

04-369

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳවයි.

සමාගමේ නාමය : අයි ටී කනෙක්ට් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 91444
ලියාපදිංචි දිනය : 2013.03.13
ලියාපදිංචි ලිපිනය : 5 වන මහළ, අංක 428, ආර් ඒ ද මෙල් මාවත, කොළඹ 03.

ලේකම්වරුන්.

04-370

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳවයි.

සමාගමේ නාමය : හේසෝන් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 60053
ලියාපදිංචි දිනය : 2007.06.05
ලියාපදිංචි ලිපිනය : අංක 673/පී 11, කන්දවත්ත, තලංගම, පැලවත්ත, බත්තරමුල්ල.

ලේකම්වරුන්.

03-371

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව මෙයින් දන්වමු.

ලියාපදිංචි සමාගමේ නම : ගෝල්ඩ් ඩයින් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 91547
ලියාපදිංචි කළ දිනය : 2013.03.14
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 190, හිල් වීදිය, දෙහිවල

ලියාපදිංචි සමාගමේ නම : මාදි රිසෝට් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 91653
ලියාපදිංචි කළ දිනය : 2013.03.21
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 129/1, ශ්‍රී සංරණංකර පාර, දෙහිවල.

ෆයිනෑන්ෂියල් ඇන්ඩ් බිස්නස් ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

04-373

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## ඉඩමක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

සණස ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ්
සීමාසහිත සණස සංවර්ධන බැංකුව යන
නාමයෙන් ද, හැඳින්වේ.
අංක 340 2/1, ආර්. ඒ. ද මැල් මාවත,
කොළඹ 03, නව ලිපිනය
අංක 12, එඩ්මන්ටන් පාර, කිරුළපන, කොළඹ 6.

නඩු අංකය :
262/එම් (උගස්
නිශ්චල)

*පැමිණිලිකරු*..........................

*එදිරිව*

01. වීරතුංග ආරච්චිගේ අමල් ජයන්ත රාජපක්ෂ
අංක 71/3, වීරකැටිය පාර,
තංගල්ල.

02. සිංහාධිපතිගේ රණවීර,
අංක 110, ගොඩපරගහලන්ද, හල්පිට, පොල්ගස්ඕවිට
දැනට අංක 78/22, අරලිය පෙදෙස,
වික්‍රමසිංහපුර, බත්තරමුල්ල.

*විත්තිකරුවෝ*.................................

කඩුවෙල දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති විකිණීමේ අධිකාරී පත්‍රයට අනුව මෙම නඩුවේ ඇතුළත් කර ඇති 2012.07.11 දිනැති තීන්දු ප්‍රකාශය ප්‍රකාරව ඉහත 1 වැනි විත්තිකරුගෙන් පැමිණිලිකරුට අයකර ගැනීමට ඇති රුපියල් හාර ලක්ෂ අනූපන්දහස් පන්සිය පහලොවයි ශත දෙකක (රු. 49,515.02) මුදලක් හා රුපියල් හාර ලක්ෂ හතලිස් එක් දහස් නවසිය අසූ හතරයි ශත පනස් හයක් (රු. 4,41,984.56) හා ඒ මත 2009.06.10 වැනි දින සිට වර්ෂයකට 26% ක් බැගින් වූ පොලිය ද, 2007 නොවැම්බර් මස 22 වැනි දිනැති අංක 396 උකස් ඔප්පුව යටතේ 2012.11.19 වැනි දිනට රු. 9,70,401.07 ක හිඟ මුදලක් ද, අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන ලෙසට මා වෙත නියෝග කර ඇති බැවින් එකී දේපළ 2013 මැයි මස 07 වැනි දින පෙරවරු 11.00ට එකී දේපළ පිහිටි ජඹුරලියේ දී ම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

*දේපළට පිවිසෙන මාර්ගය*.- කොළඹ හොරණ පාරේ කැස්බෑව හංදියෙන් දකුණට ඇති බණ්ඩාරගම පාරේ ගොස් ආයුර්වේද හංදියෙන් දකුණට ඇති පාරේ පන්සල හංදියෙන් වමට හැරී මීටර් 100ක් පමණ ගිය තැන මෙම දේපළට යාමට ඇති කොන්ක්‍රීට් මාර්ගයෙන් ගිය විට මෙම දේපළ හමුවේ.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් මුදල් දේපළ ගැණුම්කරු විසින් වෙන්දේසිකරු වන මා වෙත ගෙවිය යුතු ය. සියලුම මුදල් බැංකු අණකරයකින් හෝ මුදලින් පමණක් ගෙවිය යුතු අතර චෙක්පත් භාර ගනු නොලැබේ.

01. සම්පූර්ණ ගැණුම් මුදලෙන් සියයට විසිපහක (25%) මුදලක්. ඉතිරි සියයට හැත්තෑපහක (75%) මුදල වෙන්දේසි දින සිට දින තිහක් (30) ඇතුළත කඩුවෙල දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතු ය.

02. වෙන්දේසිය ප්‍රසිද්ධියට පත් කිරීමේ *ගැසට් පත්‍රයේ* සහ පුවත්පත් දැන්වීම් ඇතුලු සියලුම ප්‍රචාරක වියදම් හා විකිණීමේ කොන්දේසි සහතික කිරීමේ නීතිඥ ගාස්තු,

03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල සම්පූර්ණ ගැණුම් මුදලින් සියයට දෙකහමාරක් (2 1/2%)

04. කැස්බෑව නගර සභාවට ගෙවිය යුතු 1% ක විකුණුම් බද්ද,

05. ලිපිකරු හා සෝෂක ගාස්තු.

*අයිතිය හා ඔප්පු පිළිබඳ විමසීමට* - ණය අයකිරීමේ කළමනාකරු, සණස බැංකුව, බත්තරමුල්ල.

දුරකථන අංක : 011-2866994.

එන්. ජේ. එදිරිසිංහ,
උසාවි කොමසාරිස්, වෙන්දේසිකරු
හා තක්සේරුකරු.

2013 මාර්තු මස 25 වැනි දින,
අංක 244, පරණ කොට්ටාව පාර,
ඇඹුල්දෙනිය, නුගේගොඩ.
දුරකථන අංකය : 0777-453463.

04-338

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - අනුරාධපුර ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

අනුරාධපුර නගරයට සමීපව අත්තිකුලම ගමේ විජය මාවතේ පිහිටි ඉඩමට බලයලත් මානක ටී. බී. ආරියසේන විසින් සාදන ලද 2005 ජූනි මස 10 වැනි දින අංක 2083 දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කරන ලද ලොට් 01 නමැති ඉඩමේ කොටස හා එහි තුළ පිහිටි නිවාස ගොඩනැගිල්ල, ගහකොළ, වැවිලි යනාදිය හා සියලු දේ.

ඉඩමේ ප්‍රමාණය : පර්චස් 34

මෙම දේපළ දොන් මහේෂ් අතලගේ බන්ධනදායී වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපලට පිවිසීම*.- අනුරාධපුර කඩ පනහ සිට ගුවන් තොටුපොල මාර්ගයේ කි. මී. 01ක් පමණ නුගේ හන්දිය දක්වා ගමන් ගන්න. මෙහිදී වම් දෙසට හැරී ට්‍රාන්ස්ෆෝමර් හන්දිය දක්වා පැමිණ නැවත වම් දෙසට හැරී තුංමං හන්දිය දක්වා ගමන් ගෙන දකුණු දෙසට ඇති පාරට පිවිස එම පාරේ මීටර් 250ක් පමණ ගමන් ගත් විට මෙම පාරේ දකුණු පසින් අදාළ දේපළ පිහිටා තිබේ.

2013 ක් වූ මැයි මස 03 වැනි දින පෙ.ව. 10.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2010.08.27 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2010.09.06 දින දිවයින, ද අයිලන්ඩ් හා තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය*.- මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය :-

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

*හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න* : ජ්‍යෙෂ්ඨ කළමනාකාර තැන (අයකිරීම්), හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011-2661835, 011-2661836, 01- 2661826.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකථන අංක :081-2210595, 071-4755974, 071-8446374, 077-7761706.

04-313

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : කේ/5/7026/කේවයි 4/288.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබුවාවූ ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2010.06.24 *ගැසට් පත්‍රයේ* සහ 2011.02.25 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථොක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය වාද්දුව, තල්පිටිය උතුර, මැද පාර, අංක 40 හි බලයලත් වෙන්දේසිකාර ඩී. පී. එල්. සී. ද සිල්වා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2013.05.03 වැනි දින පස්වරු 2.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ දකුණ මාතලේ මැද සිය පත්තුවේ උකුවෙල, පිහිටි මඩමේ වත්ත සහ යාව පිහිටි වැලිගොඩවත්ත නම් වූ ඉඩමට 2002.06.07 වැනි දින බලයලත් මිනින්දෝරු ඩබ්. ඩී. දසනායක විසින් මැන සකසන ලද අංක 6697 දරන පිඹුරේ කැබලි අංක 2 ලෙස බෙදා වෙන් කර දක්වා ඇති ප්‍රමාණයෙන් අක්. 0 රූ. 0 පර්. 14.0ක් වූ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ.

මෙය මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 547/75 යටතේ ලියාපදිංචි වී ඇත.

මෙම ඉඩමට ප්‍රවේශ මාර්ගය ලෙස අංක 6697 දරන පිඹුරේ (මාර්ග අයිතිය අඩි 10 පළල පාර) කැබලි අංක 6 සහිත කොටස වේ.

ඩබ්ලිව්. ජේ. කේ. ගීගනගේ (මිය),
*වැඩබලන සාමාන්‍යාධිකාරිනී.*

2013 මාර්තු මස 19 වැනි දින,
කොළඹ 03,
ගාලු පාරේ අංක 269.

04-389

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.